මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පයේෂණ වාක්කෝෂය
Encyclopaedic Dictionary of Humanities and Social Science Research
Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura

# ස්වාපදාන අධ්‍යයනය

## *Autobiographical Study*

ස්වාපදානය (Autobiography) යනු රචකයා විසින් ම සිය ජීවන වෘත්තාන්තය රචනා කිරීම යි. වෙන අයකු විසින් රචනා කරනවා වෙනුවට සිය චරිතය සියතින් ම රචනා කිරීම මෙහි දී සිදු වේ. ඒ නිසා ස්වාපදානිකයා ජනප්‍රිය චරිතයක් ම විය යුතු නැත. ඇතැම් ස්වාපදාන ප්‍රබන්ධ කතා (Fictions) ලෙසත් නවකතා (Novels) ලෙසත් රචනා කර ඇති අවස්ථා බොහෝ ය. චාලර්ස් ඩිකන්ස් (Charles Dickens), ඩේවිඩ් කොපර්ෆීල්ඩ් (David Copperfield), හා ජේ. ඩී. සැලින්ජගෙර් (J. D. Salinger) ආදීන්ගේ ස්වාපදාන නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය (Czarniawska, 1998). වතර්මානයේ නව මාධ්‍ය දියුණුවත් සමඟ සමාජ මාධ්‍ය (social media), බ්ලොග් (Blogs), කෙටි වීඩියෝ පට ආදිය ඔස්සේ ස්වාපදාන ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් ස්වාපදාන අධ්‍යයන අනාගත පයේෂණ ක්ෂේත්‍රයේ නව දිශානති ඔස්සේ වධර්නය විය හැකි අංශයක් ලෙස සැලකිය හැකි ය.

ස්වාපදාන අධ්‍යයනය (Autobiographical Study), ගුණාත්මක පයේෂණ ක්‍රමශිල්පයකි (Qualitative Research Methodology). ස්වාපදාන, ස්වයං චරිතාපදාන, ස්වයං ලිඛිත චරිතාපදාන යනු සමාජවිද්‍යාව (Sociology), මනෝවිද්‍යාව (Psychology), මානවවිද්‍යාව (Anthropology), වෘද්ධවිද්‍යාව (Gerontology), ඉතිහාසය (History), නීතිය (Law), වෛද්‍යවිද්‍යාව (Medicine) මානවවංශවිද්‍යාව (Ethnography) ආදි විෂය ක්ෂේත්‍රවල පයේෂණ ක්‍රමශිල්පයක් ලෙස යොදාගැනේ (Prideaux,1991). ජීවිතාතීත පයේෂණ (Life History Research) යටතේ ගැනෙන පයේෂණ වගර්යක් ලෙස ස්වාපදාන අධ්‍යයනය ගත හැකි ය. ජීවිතාතීත පයේෂණවල දී බොහෝ විට අතීත සිද්ධි සමඟ සබැඳුණ පුද්ගල අද්දැකීම් අධ්‍යයනය කරනු ලැබේ. ප්‍රලේඛන පයේෂණවල (Documentary Research) දී ද ස්වාපදාන අධ්‍යයනය සිදු කරන අවස්ථා දැකගත හැකි ය (Boucher & Holian, 2001).

ජීවිතාවලෝකනය ස්වාපදාන අධ්‍යයනවල බෙහෙවින් වැදගත් වේ. ස්වාපදාන අධ්‍යයනවල දී ජීවන වෘත්තාන්ත (Life Stories), වාචික විත්ති (Verbal Information), කායර්ාලයීය හා පෞද්ගලික ලියකියවිලි (Official and Personal Documents), දිනපොත් (Diaries), සිහිවටන (Souvenirs), පුද්ගලික ලිපි (Letters), වීඩියෝපට (Video Clips) හා ඡායාරූප (Photographs) ආදි ආනුභවික මූලාශ්‍ර (Empirical Sources) රැසක් යොදාගැනේ. ස්වාපදාන අධ්‍යයනවල දී ධාරණය (Memory) බෙහෙවින් වැදගත් වේ (Ellis, 1999). එහි දී රචකයා සිය ජීවිතයේ බොහෝ සිදුවීම් හා අවස්ථා පිළිබඳ වාතර්ා කරයි. අධ්‍යයනයට පාත්‍ර වන චරිතය පුද්ගලයකු ලෙස ගොඩ නැඟී ඇති අයුරු ඔවුන්ගේ වෘත්තිය හා පෞද්ගලික ජීවිතය, සඤ්චාර, අධ්‍යාපනය, සමාජ සේවා ආදි විවිධ තොරතුරු ඊට ඇතුළත් වේ. එහි දී රචකයා විවිධ වූ දෑ පිළිබඳ ස්වකීය දශර්නය, අභිමත ආදිය හෙළි කරනු ලැබේ. එසේ ම විවිධ සිදුවීම් පිළිබඳ ස්වකීය පයේෂණ හා මතක ගෙන හැර පායි. ඒකපාශර්වීය දෘෂ්ටිකෝණයකින් ලියවුණත් ඇතැම් ඓතිහාසික තොරතුරු ගවේෂණයේ දී ස්වාපදාන අධ්‍යයනය බෙහෙවින් වැදගත් වේ. ඇතැම් රචකයන් ස්වකීය පයේෂණ හා අත්හදා බැලීම් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම නිසා පයේෂණ මූලාශ්‍ර ලෙස ඒ ස්වාපදාන යොදාගත හැකි ය. ස්වාපදාන බොහෝ ගුරුවරුන්ට, අධ්‍යාපනවේදීන්ට, ශිෂ්‍යයන්ට සහ ගුරු අධ්‍යාපනය හා ඉගැන්වීමේ ඉතිහාසය ගැන පයේෂණ කරන්නන්ට වැදගත් මූලාශ්‍ර වෙයි (Bish, 1992).

ස්වාපදාන යනු මතකය ප්‍රතිනිමර්ාණය කරන සාහිත්‍යය ප්‍රවගර්යකි. එහි දී ප්‍රතිනිමර්ාණය කරන මතක තේරීමේ සම්පූණර් බලය ඇත්තේ එහි රචකයා වන ස්වාපදානිකයාට යි. මේ නිසා තම මතකය අනුව තමා පිළිබඳ ව ස්වාපදාන රචකයා සිදු කර ඇති ස්වයං අධ්‍යයනය සහ මානය අනුව මෙන් ම සමාජය තුළ ගොඩ නඟාගත් චරිත වටිනාකම් අනුව තොරතුරු ඉදිරිපත් කිරීම හෝ නොකිරීම සිදු කළ හැකි ය. මෙහි දී පෞද්ගලික අථර්කථන (Personal Interpretations) බොහෝ විට දැකගත හැකි ය. මෙය මේ පයේෂණවල දැකගත හැකි අභියෝගයක් වන අතර ස්වාපදානවලින් දත්ත උත්පාදනය කිරීම ද තවත් අභියෝගයකි. මේ නිසා දත්ත සත්‍යාපනය කිරීම උදෙසා තුලනාත්මක ප්‍රලේඛන සමීක්ෂණයක් (Contemporary Documentary Survey) සිදු කළ හැකි ය (Cherry, 2000). සාම්ප්‍රදායික පයේෂණ දත්ත හා සංසන්දනය කිරීමේ දී ස්වාපදාන දත්ත වෙනස් ආරක් ගනී. මෙහි දී අවශ්‍ය දත්ත තෝරාගැනීම ඉතා වැදගත් ය. ස්වාපදාන අධ්‍යයනවල ඇත්තේ ගුණාත්මක දත්ත විශ්ලේෂණයකි. දත්ත විශ්ලේෂණය කිරීම සාමාන්‍යයෙන් පයේෂකයා තනි ව කළ යුතු කායර්යක් වුවත් ස්වාපදාන දත්ත විශ්ලේෂණයේ දී සුපරීක්ෂකයකුගේ සහාය ලබාගැනීම වැදගත් වේ. වතර්මානයේ නව මාධ්‍ය දියුණුවත් සමඟ ස්වාපදාන රචනය සමාජ මාධ්‍ය, බ්ලොග් සටහන්, කෙටි වීඩියෝ පට ආදිය ඔස්සේ ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් ස්වාපදාන අධ්‍යයන අනාගත පයේෂණ ක්ෂේත්‍රයේ නව දිශානති ඔස්සේ වධර්නය විය හැකි අංශයක් ලෙස සැලකිය හැකි ය.

*අමිල ලොකුමාන්නගේ*

### මූලාශ්‍ර නාමාවලිය

Bish, A. J. (1992). An action research evaluation of mechanisms for reflection in a postgraduate psychology course. Unpublished MPsychOrg, St Lucia. Queensland University.

Boucher, C. & Holian, R. (2001). Emerging forms of representing qualitative data. Melbourne: RMIT Press.

Cherry, N. (2000). Action research: A pathway to action, Knowledge and learning. Melbourne: RMIT Publishing.

Coffey, A. (1999). The ethnographic self: Fieldwork and the representation of identity. London: Sage.

Czarniawska, B. (1998). A narrative approach to organization studies. Thousand Oaks: Sage.

Ellis, C. (1999). Heartful auto ethnography. Qualitative Health Research, 5(8), pp. 669-683.

Prideaux, G. (1991). Applying learning principles to the development of health services managers. The Journal of Health Administration Education, 9(2), pp. 215-251.

Copyright © 2023 Center for Digital Education and Professional Development, Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura, Sri Lanka. All Rights Reserved.

Powered By **CDEPD.**

v.1.2.6